ඇත්ත කෙටි කතාව

# අනුන්ගෙ කකුලක බැන්ඩේජ් එක මගේ කකුලට ආ හැටි!



මට අවුරුදු විස්සක් වෙන කල්ම අපි ජීවත්වුණේ මරදානෙ පොලිස් නිවාස වල. තාත්තා විශ්‍රාම ගියාම තමයි අපි රාජගිරියෙ මාදින්නාගොඩට සම්ප්‍රාප්ත වුණේ.

ඔය පොලිස් නිවාස බ්ලොක් නවයක් එතන තිබුණා. එක බ්ලොක් එකක ගෙවල් දහසයයි. බ්ලොක් දෙකක් තිබුණෙ පොඩි බෑවුමක. එයට ඉස්සරහින් ටිකක් ගැඹුරු කාණුවක් තිබුණා වැස්සම වතුර බැහැලා යන්න. මේ සිද්ධිය වෙච්ච කාලෙ මගේ වයස අවුරුදු හතක් විතර කියලයි මට මතක. මම ඒ කාණුවට බැස්සම ඒක මගේ පපුව හරියට විතර ඇති. අපේ නිවාසවල ඉන්න ළමයින්ගෙ ඒ කාලෙ පුරුද්දක් තමයි එතනින් යනකොට කාණුවට බැහැලා, ඒක දිගේ ගිහිල්ලා, පාරට ගොඩවෙන එක. වැහි දාට විතරයි ඒ කාණුවෙ වතුර පිරෙන්නෙ.

දවසක් උදේ හොඳටෝම වැස්සා. ඉස්කෝලෙ යන්න කම්මැලියි. මටත් ටිකක් හෙම්බිරිස්සාව වගේ. අම්මට කන්කෙඳිරිගාලා ගෙදර හිටියා ඉස්කෝලෙ යන්නෙ නැතුව. එදා අපේ ලොකු අයියත් ගෙදර. ෆුට් බෝල් ගහන්න ගිහිං විළුඹ උළුක්කරගෙන. එයා වැඩිය කැමතිවුණේ නැහැ මම ගෙදර ඉන්න එකට. ඒත් අම්මගෙ කැමැත්ත ලැබුණ නිසා මං ගෙදර හිටියා. ඉතින් ගෙදර මමයි අයියයි විතරයි. අම්මා ඉස්කෝලෙ ගිය හැටියෙ, මම පාරට බැස්සා කඩේට ගිහින් ලොසින්ජර අරං එන්න. දැන් වහිනව වුනත් ඇඟට පතට කිසි අමාරුවක් නෑ. හෙම්බිරිස්සාව සනීපවුණා වගේ.

ඉතින් සුපුරුදු විදියට අර කාණුවට බැහැලා පාර පැත්තට යන්න හදන කොට මම දැක්කා බිඳිච්ච ඔරේන්ජ් බාර්ලි බෝතලේක අඩියක්. ඒකෙ හොඳට උල් වෙච්ච කැලි තිබුණා. මට හොඳ කල්පනාවක් ආවා. දාන්න ඕන මේක කාණුවට මෙතනින් යන කොල්ලෙකුගෙ කකුල කැපෙන්න. ඉතින් ඒ සත්ගුණවත් සිතිවිල්ලෙන් මම ඒ බෝතල් කටුව අරගෙන කාණුවට දැම්මා. දාලා කාණුවෙ බැහැලා පාර පැත්තට ගියා. විලුඹට ටිකක් උඩින් වතුර පාරක් ගලමින් තිබුණා.

මරදාන පාරෙ කඩේකින් ලොසින්ජර අරගෙන, එයින් එකක් දෙකක් කටේ දාගෙන මම ආපහු ආවා. ගිය විදියටම ආපහු කාණුවට බැහැලා ගෙවල් පැත්තට එන්න පටන් ගත්තා. කාණුවෙන් ගොඩ වෙන්න අඩි දෙක තුනක් තියා එක පාරටම මගේ කකුලෙ මොකක් හරි වැදිලා චිරිස් ගාන සද්දයක් ආවා. මම කකුල උස්සලා බැලුවම පයිප්පයකින් වගේ ලේ පාරක් විද්දා යටිපල්ලෙන්. ලේ ගලාගෙන කාණුවෙ වතුරට එකතුවෙලා වතුර රතුපාට වෙනවා මට පෙනුණා. හොඳට ඇහැ ඇරලා බැලුවම අර මම දාපු බෝතල් කට්ට කාණුව පතුල දිලිහි දිලිහි තියනවා. අමාරුවෙන් කාණුවෙන් එළියට ඇවිල්ලා නොන්ඩි ගගහා ගෙදර ගියා. පාර දිගට ලේ. ගෙදර යනකොට සෙරෙප්පුව ලේවලට කකුලට ඇලිලා. මොනව කරන්නද අයියට කියන්න විදියක් නෑ. ටොක්කක් ඇනලා තමයි වෙච්ච දේ අහන්නෙ. තුවාලෙ පරණ රෙදි කැල්ලක් අරං යන්තම් ඔතාගත්තා. ඒක ඉංග්‍රීසි එල් අකුරෙ හැඩේට කැපිලා තිබුණෙ. ඇද්දුම් කනවා ඉන්න බෑ.

ඉතින් දවල් වෙන කොට ආවා අපේ ඉස්පිරිතාලෙ සීයා. එයා මහ ඉස්පිරිතාලෙ වැඩ කළේ. අයියගෙ උළුක්කු වුණු කකුලට බේත් බැන්දෙ ඒ සීයා තමයි. හොඳ ක්‍රේප් බැන්ඩේජ් එකක් අයියගෙ කකුලෙ ඔතලා තිබුණා. ඉතින් සීයා එනකොට මම හිටියෙ කුස්සියෙ හැංගිලා. අයියගෙ කකුලට හොඳට බෙහෙත් ගාලා ක්‍රේප් බැනිඩේජ් එකෙන් වෙලුවා. ඉවරවෙලා යන්න හදන කොට මම "සීයෙ......" කියලා කිව්වා.

"ඇයි පුතේ ? "

"සීයෙ මේ මගේ කකුල......"

කියලා තුවාලෙ තියන දිහාවට ඇඟිල්ල දික්කළා. ĭ මොනව වෙලාද...." ? කියලා සීයා ඇහුවා. අයියා එක පාරටම කිව්වා

"සීය යන්න....... මෙයා මේ ගලකට හප්පගෙන පොඩි තුවාලයක් වෙන්න ඇති......." කියලා

සීයා කුස්සියට ඇවිල්ලා මගේ කකුල දිහා බැලුවා. ඔතලා තිබුණු රෙදි කැල්ල ලේ වලින් පෙඟිලා. සීයා දෙකට නැමිලා මගේ කකුල එයාගෙ දනිස්ස උඩින් තියාගෙන රෙදි කැල්ල ගැලෙව්වා.

"බුදු අම්මේ......" සීයා ඔලුවෙ අත ගහගත්තා. මාව වත්තන් කරගෙන ගිහිල්ලා පුටුවක වාඩි කෙරෙව්වා. අරගත්තා අයියගෙ කකුල. තිබ්බා බංකුවක් උඩින්. ගිඩි ගිඩි ගාලා ගැලෙව්වා එයාගෙ කකුගෙ ඔතලා තිබුණු ක්‍රේප් බැන්ඩේජ් එක. අයියා ඇස් දෙක උඩතියන් බලං ඉන්නවා. මම ජනේලෙන් අහක බලන් හිටියා.

" අනේ පුතේ මේකට මැහුම් දහයක්වත් දාන්න වේවි...... " කිය කියා සීයා මගේ යටි පතුලට මොන වද බේතක් තියලා අර ක්‍රේප් බැන්ඩේජ් එකෙන් වෙලුවා. ඉක්මනට ටැක්සියක් ගෙන්නගෙන මාව අරං ගියා මහ ඉස්පිරිතාලෙට. දැම්මා මැහුම්. ආපහු ගෙනැල්ලා ගෙදර බැස්සුවා.

ඒ වෙන කොට අම්මා ගෙදර ඇවිල්ලා. මං දැක්කා අයියා මොකක්ද රෙදි කැල්ලක් විලුඹේ ඔතාගෙන ඉන්නවා. අයියා කේන්තියට මොනව කිව්වද දන්නෙ නෑ. ඒත් අම්මා මට මුකුත් කියන්නෙ නැතුව බදාගත්තා.

තාමත් ඉඳලා හිටලා මතක් වෙනවා ඉස්පිරිතාලෙ සීයා එදා ක්‍රේප් බැන්ඩේර් එක අයියගෙ කකුලෙන් ගලවපු ඉක්මනයි ඒක මගේ කකුලෙ ඔතන කොට අයියගෙ මූණෙ හැටියි.

අහෝ ! ඒ ළමා විය ! කියලා වැඩක් නෑ !

♦ නීතිඥ
අනුර හෑගොඩ London







## කිරි කළයට වැටුණු ගොම බිංදුව

මනුෂ්‍යයින් හා හරක් අතර සම්බනධකම් තිබුණට ඒ හරක් ආම්බාන් කරන්න, ඒ කියන්නෙ හරියට පාලනය කරන්න මිනිස්සු දැනගන්න ඕන. ඒ පාලනයක් නැතිවුනාම තමයි හරක් වළං කඩවලට පනින්නෙ. ගොනා කරත්තෙ බඳින්න ඉස්සෙල්ලා නහය විදලා ලණුවක් දානව. ඊට පස්සෙ මිනිස්සුන්ට පුළුවන් අර ලණුවෙන් ඇදලා ගොනාව හසුරුවන්න. කරත්තෙ බඳින්න. ඌට කියලා බඩු අදින්න. මේ ලණුව දාන ක්‍රමය මිනිස් සමාජයට කොයි කාලෙ ආවද කියන්න අපි දන්නෙ නැහැ. නමුත් හරක් හික්මවන්න තියන එකම ක්‍රමයත් එච්චරයි.

හරක් හදන කොට එන ඊළඟ ප්‍රශ්නෙ තමයි මඩුව සුද්ද කරන එක. හරක් හදනව නම් කොහොමත් ඒක කරන්න එපැයි. ගොම, ගොම බෙටි, ගොම්පස් ඔය ආදී නම්වලින් හඳුන්වන ගොම වලින් හැදෙන මීතේන් සහ ඇමෝනියා වායු හෙවත් ගෑස් නිසා වායුගෝලය රත්වෙලා අද ලෝකයට මහා ව්‍යසනයක් වෙලා තියන බව විද්‍යාඥයො කියනවා. මේ පැට්‍රල් ඩීසල් තෙල් වලින් නගින දුමට වඩා ගවයින්, ගවපට්ටි බෝකිරීම ඉතා ඉක්මනින් ලෝක විනාශයකට හේතුවක් වන බව දැන් සොයා ගෙන තියනවා. විහිළු නෙවෙයි, ගොම බෙට්ට අපි හිතුවට වඩා විනාශකාරී දෙයක් බව දැන්වත් හිතට ගන්න!

Cow dung contributes to serious environmental problems by producing Methane and Ammonia gasses. ( FAO Report )

ගොමවල ප්‍රතික්‍රියාව ගැන අපේ ගම්වල මිනිස්සු පවා මේ දේ හොඳින් වටහාගෙනයි ඉන්නෙ. වැස්සිගෙන් කිරිදොවන කොට ඉතා ප්‍රවේසම් වෙනවා ඒ කිරි භාජනේට ගොම මිශ්‍ර නොවෙන්න. වැඩිය ඕන නෑ ලොකු කිරි කළේකට ඇල්පෙනෙත්ති තුඩක සියුම් ප්‍රමාණයක් හරි ගොම අබිත්තක් ඉහුණොත් අර කිරි සේරම තත්පර ගණනකදී කැටි ගැහිලා නරක් වෙනවා. ඒ කිරි කළේම ඉවරයි. ඒකෙන් තමයි කිරි කළේකට ගොම බිංදුවක් වැටුණ වගේ කියන ප්‍රසිද්ධ සිංහළ කියමනක් හැදුණේ. ඒ කියන්නෙ ඕනම හොඳ වැඩකට නිකං හරි නරක මිනිහෙක් ගැවුණොත් ඉවරයි එතන වෙන්නෙ මහ විනාසයක්.

මේ වර්තමාන රජය ඉතා උපක්‍රමශීලීව සහ අපේ සන්නද්ධ හමුදාවල දක්ෂතා නිසාම දිනන්න බැරිය කියලා පැත්තකට දාන්න ලෑස්තිවෙලා තිබුණු යුද්ධයක් දිනුවා පමණක් නොවෙයි, ඒ ත්‍රස්තවාදී නායකයන් සියල්ලද විනාශ කර දැමුවා. ඒක මෑත ඉතිහාසයේ ඉහලින්ම සටහන් වියයුතු දෙයක්. නමුත් අපි කවුරුත් බලාපොරොත්තු වුණු 'වෙල් ඩන් ශ්‍රීලංකා' අත්පුඩි පාර ලෝකෙන් ආවෙ නෑ. ඒ වෙනුවට මානව හිමිකම් කඩකිරීම්, ලේඛකයන් පත්‍රකලාවේදීන් අතුරුදහන්වීම්, යුද අපරාධ චෝදනා ආදිය දස අතින් එල්ල වෙනවා. ලංකාව ජාත්‍යන්තර උසාවියට ගෙනියන්න හදනවා. එක්සත් ජාතීන්ගෙ මණ්ඩලේ ඡන්දෙනුත් අපි පැරදුණා. අපි ගැන හොඳින් දන්න ඉන්දියාව පවා අපිට විරුද්ධව වැඩ කළා. අපට ලෝකෙ හිතවත් රටවල් ද නැතුව යනවා. මේ විදියට අපි ලෝකෙ තනිවෙනවා.

ඉතින් ලංකාව පුලුවන් තරම් දඟිරිය දානවා මේ යුද අපරාධ චෝදනාවලින් බේරෙන්න. ලංකාවෙ වගේම ලෝක පුරාම ඉන්න දේශප්‍රේමී ලාංකිකයො ඒ ඒ රටවල ඇම්බසි ඉස්සර විරෝධය පානවා. වෙබ් අඩවි හදලා යුද්ධය දිනුවෙ හරි විදියට කියලා විස්තර යවනවා. අපි නෙවෙයි මේ බලන්න! කොටි තමයි ම්ලේච්ච විධියට වැඩකළේ, ඝාතන කළේ කියලා පින්තූර හොය හොය යවනවා. චැනල් 4 එකට එරෙහිව විරෝධතා දක්වනවා.

මේ සේරම අස්සෙ මර්වින් සිල්වා කියන මැටි මෝල් ඇමති ප්‍රසිද්ධියේම කියනවා, මම තමයි ඔය කියන ලේඛකයො ටික ගහලා එලෙව්වෙ, ආයි හම්බවුනොත් උන්ගෙ ඇඟිලි ටික කපන වා. හතර හන්දි බිඳිනවා. ඉළඇට කුඩුකරනවා. කියලා. මර්වින් ඒ කියපු දේවල් දැන් ලෝක පුරාම ප්‍රචාරය වෙනවා. ඉතින් කොහොමද ලංකාව යුද අපරාද චෝදනාවලින් බේරෙන්නෙ ලංකා ආණ්ඩුවෙම ඇමතියෙක් කියනව නම්, ඔව්! අපි ඒවා කළා තමයි කියලා. මර්වින් සිල්වා කියන්නෙ ගොම බිංදුවක් නෙවෙයි! එහෙම්පිටින්ම ගොම තැම්බක්! අනේ අපේ රට!

♦ වෙලේගෙදර රාළ London

# අපේකම ලන්ඩන් වේදිකාවට ගෙනෙන

# හෙළ දරු වරුණ

එක්සත් රාජධානියේ වෙසෙන ශ්‍රී ලාංකීය දෙමාපියන්ගේ දරුවන් විසින් කරලියට ගෙන එනු ලබන **හෙළ දරු වරුණ** සංස්කෘතික කළා මංගල්‍යය මෙවර **2012** අප්‍රේල් මස **21** වෙනි සෙනසුරාදා සවස **6.00** සිට **9.00** දක්වා ලන්ඩන් නුවර හවුන්-ස්ලෝ ප්‍රදේශයේ පිහිටි **Lampton School** ශාලාවේදී වේදිකාගතවීමට නියමිත ය.

හෙළ දරු වරුණ වෙනත් ඔබ දැක ඇති ප්‍රසංග වලට වඩා වෙනස් මගක් ගත් ප්‍රසංගයකි.

♦ ප්‍රසංගය ආරම්භයේ පටන් අවසානය දක්වාම සම්පූර්ණයෙන්ම එය මෙහෙයවන්නේ එංගලන්තයේ ජීවත් වන පාසල් වයසේ පසුවන අපේම දූ දරුවන් වන අතර එහි සුවිශේෂීම කාරණය නම් ඔවුන් එය අපේ හෙළ බසින්ම පමණක් ඉදිරිපත් කිරීම ය.

♦ අපේ හෙළ සංස්කෘතියේ නර්තනාංග අතරින් වන්නම්, වෙස් නැටුම්, ගිරි දේවි සමගින් ජන කවි, ජන ගායනා, වේදිකා නාට්‍යයමය ජවනිකා, ළමා ගීත, ගැමි නැටුම් ඇතුළු තවත් බොහෝ අංගයන් මෙම ප්‍රසංගය ඔස්සේ කරළියට පැමිණේ.

♦ ප්‍රසංගයට සහභාගි වන සියළුම දරුවෝ සිංහල ජාතික ඇඳුමින් සැරසී එහි සියළු කටයුතු කරති.

♦ මේ ප්‍රසංගය නොමිළයේ පැවැත්වෙන අතර එක්සත් රාජධානිය පුරා විසිරී සිටින වයස අවුරුදු 3 සිට 18 දක්වා දූ දරුවන් සියයකට අධික ප්‍රමාණයක් එකම වේදිකාවක එකට හමු වන එකම අවස්ථාව මෙයයි.

හෙළ දරු වරුණ කළා මංගල්‍යය මීට පෙර 2007 වසරේ දෙසැම්බර් මස 08 දා සහ 2009 ඔක්තෝම්බර් මස 17 දා ලෙස දෙවතාවක් ලන්ඩනයේ වේදිකාගත වූ අතර මෙවර එය තෙවන වතාවටත් තවත් නැවුම් වූ අංගයන් සමගින් වේදිකා ගතවීමට නියමිතයි. නර්තන ආචාර්ය ඒ. පී. අත්තනායක සමගින් රසිකා කුමාර ගේ සහ මධූකා මාරසිංහ නර්තනා-චාරිනියන් ඇතුළු අනෙකුත් වැඩිහිටි යන්ගේ ගුරුහරුකම් මැද අපේ දරු-වෝ කරළියට බසින්නට මේ වන විට ලහිලහියේ සූදානම් වෙති.

නොමිලයේ පැවැත්වෙන මෙම ප්‍රසංගය සඳහා සීමිත ආසන ප්‍රමාණයක් ඇති බැවින් ඒ සඳහා ආරාධනා පතක් ලබා ගත යුතු අතර

**07870518849, 07412092300, 07712519780** හෝ **02072720963**

අංකයන්ට ඇමතීමෙන් ඔබටත් මේ සඳහා අවස්ථාවක් ලබා ගත හැක.

ප්‍රසංගය අතරතුර ලැබෙන කෙටි විවේක කාලයේදී ඔබට දේශීය රසයෙන් සහ ගුණයෙන් පිරි සංග්‍රහයක් ද නොමිලයේම විඳ ගන්නට අවස්ථාව සැලසෙන අතර සැබෑ දේශීයමය රසාස්වාදයක් විඳ ගනු පිණිස හැකි පමණින් දේශීය ආරකට හුරු ඇඳුමකින් සැරසී පැමිණෙන ලෙස සංවිධායක කමිටුව ප්‍රේක්ෂක ඔබට ආයාචනා කර සිටී.

ස්වර්ණා වීරසිංහ, කමල් අභයතිලක සහ විජේරත්න බණ්ඩාර මහත්ම මහත්මීන් මෙහි සංවිධාන කමිටු සාමාජිකයන් වන අතර හෙළ දරු වරුණ සංකල්පය සහ ප්‍රධාන සංවිධායකත්වය ලන්ඩනයේ වෙසෙන ආසිරි බණ්ඩාරයන්ගේ ය.

**හෙළ දරු වරුණ**
**Hela Daru Varuna**
**The children's Show**
**conducted by children**
**April 21 Sat. 2012**
***from 6pm - 9pm***
at **Lampton School**
***Hounslow Middx***